02-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ මෙසේ පොරොන්දු වුණා: ඔබ පැමිණි විට අපි ඔබට භාරවන්නම්. පරමාත්ම පියා දැන් පැමිණ සිටින්නේ ඔබට ඒ පොරොන්දුව මතක් කර දීමටයි.

**ප්‍රශ්නය:** දේවතාවරුන් වන්දනීය අය ලෙස හැඳින්වෙන්නේ ඔවුන් ළඟ ඇති කුමන ප්‍රධාන ගති ලක්ෂණය නිසාද?

**පිළිතුර:** කිසිම කෙනෙක්ව සිහි නොකිරීමේ සුවිශේෂී ගති ලක්ෂණය ඇත්තේ දේවතාවරුන්ට පමණයි. ඔවුන් පරමාත්ම පියාව සිහිකරන්නේත් නැහැ, වෙන කිසිම කෙනෙක්ගේ ශරීරයක් සිහිකරන්නේත් නැහැ. මෙන්න මේ නිසා තමයි ඔවුන් වන්දනීය අය ලෙස හැඳින්වෙන්නේ. එහි සතුටම හැරෙන්න වෙන කිසිවක් නැහැ. මෙන්න මේ නිසා තමයි වෙන කිසිම කෙනෙක් සිහිකිරීමේ අවශ්‍යතාවයක් ඔවුනට නොමැත්තේ. එකම එක පරමාත්ම පියාව දැන් සිහි කිරීමෙන් ඔබ ඉතාමත්ම ඉහළ පාරිශුද්ධත්වයක් ලබා වන්දනීය බවට පත්වන නිසා කිසිම කෙනෙකුව සිහිකිරීමේ අවශ්‍යතාවයක් ඇති වන්නේ නැහැ.

ඕම් ශාන්ති. සුමිහිරි, ආධ්‍යාත්මික දරුවනි, ඔබලාට ආධ්‍යාත්මික ජීවාත්ම සත්ථාවක් කියා කියන්න බැහැ. ආධ්‍යාත්මය නැති නම් ජීවාත්මය දෙකම එකයි. ආධ්‍යාත්මික පියා ආධ්‍යාත්මික දරුවන්ට කියා දෙනවා. මීට පෙර පරමාත්ම පියා පරමාත්ම ජීවය කිසිඳු විටෙක ජීවාත්මයන්ට දැනුම දුන්නේ නැහැ. පරමාත්ම පියා කියන්නේ මම මුලු කල්පයෙන්ම එකම එක වතාවකට පමණක් පැමිණෙන්නේ ඒ උතුම්ම උතුම් වූ සංගම් යුගයේදීයි. වෙන කිසිම කෙනෙක්ට මෙසේ කියන්න බැහැ. කල්පයේ සංගම යුගයේ හැරෙන්න වෙන කිසිම කාලයකදී පරමාත්ම පියාට පැමිණෙන්න බැහැ. භක්තිය අවසානයක් කරා පැමිණි කළ සංගම් යුගයේදී පමණයි පරමාත්ම පියා පැමිණෙන්නේ. පරමාත්ම පියා මෙහි සිට ඔය දරුවන්ට දැනුම දෙනවා. නමුත් ජීව ආත්මයක් බව සලකා පරමාත්ම පියාව සිහිකරන්න. ඇතැම් දරුවන්ට මෙය ඉතාමත් අපහසුයි. එය ඉතාමත් පහසුයි, නමුත් ඔවුන්ගේ බුද්ධියට මෙය හොඳින් ගෝචර වන්නේ නැහැ. මෙන්න මේ නිසා තමයි බාබා ඒ අයට නැවත නැවතත් කියා දෙන්නේ. එසේ කියා දීලත් ඔවුන්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැහැ. පාසලකදීත් ඇතැම් ශිෂ්‍යයින් මාස 12 ක් පුරා ගුරුවරයා වෙහෙස වී ඉගැන්වුවත් අසමත් වෙනවා. මෙම අසීමිත පියා ඔය දරුවන්ට සෑම දිනකම උගන්වනවා. ඒ වුණත් මෙය හොඳින් ග්‍රහණය කර ගත හැක්කේ ඇතැම් අයට පමණයි. අනිත් අයට අමතක වෙනවා. ඔබට උගන්වනා ප්‍රධාන දෙය නම් තමා ජීවාත්මය බව සලකා පරමාත්ම පියා සිහිපත් කරන්න. පරමාත්ම පියාව කියනවා: නිරන්තරයයෙන් මා පමණක් සිහිපත් කරන්න. කිසිම මනුෂ්‍යයෙකුට මෙය කියන්න බැහැ. පරමාත් පියා කියනවා මා පැමිණෙන්නේ එකම එක වතාවයි. මා පැමිණ ඔය දරුවන්ට උගන්වන්නේ මුලු කල්පයෙන්ම එක් වතාවකි. සංගම යුගයේදීයි. මෙම ඥානය ලබන්නේ ඔබ පමණයි. වෙන කිසිම කෙනෙකුට ලැබෙන්නේ නැහැ. ප්‍රජාපිතා බ්‍රහ්මාගේ කටින් උපන් පරම්පරාව වන ඔබලා පමණයි මෙම ඥානය අවබෝධ කර ගන්නේ. මීට පෙර කල්පයේදී සංගම යුගයේදී පරමාත්ම පියා මෙම දැනුම ඔබට ඉගැන්වූ බව ඔබ දන්නවා. මෙම චරිත කොටස ඇත්තේ ඔය බ්‍රහ්මිණ්වරුන්ට පමණයි. ඔබ අනිවාර්යයෙන්ම මෙම කුල පසුකර යා යුතුයි. අනෙක් ආගම් වල අය මෙම කුල පසුකර යන්නේ නැහැ. භාරතවාසීන් පමණයි එම කුල පසුකර යන්නේ. භාරත වාසින් වෙන්නේ බ්‍රහ්මිණ්වරුන් පමණයි. මෙන්න මේ නිසා තමයි පරුමාත්ම පියා භාරතයට පැමිණිය යුතු වන්නේ. ඔය බ්‍රහ්මණවරුන් ප්‍රජාපිතා බ්‍රහ්මාගේ කටින් උපන් දරුවනුයි. බ්‍රාහ්මණ තත්ත්වයෙන් පසුව ඔබ දේවතාවරුන් හා ක්ෂත්‍රියන් වෙනවා. කිසිම කෙනෙක් ක්ෂත්‍රියවරයෙක් වන්නේ නැහැ. බ්‍රහ්මිණ්වරුන් බවට ඔබලා පත්කරවූ පසුව ඔබලා දේවතාවරුන් වෙනවා. ඒ දේවතාවරුන්ගේ කලාවන් පහළ බැස ගිය පසු ඔවුන්ව ක්ෂත්‍රියන් කියා හඳුන්වනවා. ඔවුන් ඉබේම ඒ තත්ත්වයට පත්වෙනවා. පරමාත්ම පැමිණ ඔබලාව බ්‍රහ්මිණ්වරුන් කරවනවා. එවිට ඔබලා බ්‍රහ්මණ තත්ත්වයෙන් දේවතාවරුන් වී ඒ දේවතාවරුන්ම පසුව ක්ෂත්‍රියන් වෙනවා. මෙම ආගම් තුනම පියා විසින් ස්ථාපනය කරන්නේ මේ කාලයේදී පමණයි. නැවතත් වතාවක් ස්වර්ණම යුගයේදී හෝ රිදී යුගයේදී ඔහු ඒ වෙනුවෙන් පැමිණෙන්නේ නැහැ. මේ ගැන මිනිස්සු නොදන්නා නිසා ඔහු ස්වර්ණම යුගයටත් රිදී යුගයටත් පැමිණෙනවායි කියා ඔවුන් කියනවා. පරමාත්ම පියා කියනවා: මම සෑම යුගයකදිම පැමිණෙන්නේ නැහැ. මම මුලු කල්පයටම එකම එක වතාවයි පැමිණෙන්නේ. ඒ මෙම සංගම යුගයේදීයි. බ්‍රජාපිතා බ්‍රහ්මා මඟින් ඔබව බ්‍රහ්මිණ්වරුන් බවට පත්කරවන්නේ මමයි. මා පැමිණේනේ උත්තරීතර දනච්චේ

සිටයි. අච්චා. එසේ නම් බ්‍රහ්මා පැමිණෙන්නනේ කොයි සිටන්ද? බ්‍රහ්මා උපත් 84 ක් ගන්නවා. මම ගන්නේ නැහැ. බ්‍රහ්මා හා සරස්වතී විෂ්ණු වෙනවා. ඒ ලක්ෂ්මී හා නාරායන්ගේ ද්විත්ව ස්වරූප යයි. ඔහු උපත් 84 ක් ගන්නවා. පසුව උපත් ගණනාවක අවසානයේදී මා ඔහුට ඇතුලු වී ඔහුව බ්‍රහ්මා කරවනවා: මම ඔහුව බ්‍රහ්ම යන නම තබනවා. මොහුගේ නම ඔහු විසින්ම නොවෙයි. දරුවෙක් ඉපදී හය වන දිනයේදී එම දරුවාගේ කේන්ද්‍රයට අනුව ගැලපෙන නමක් තැබීමේ උත්සවයක් පවත්වනවා. උපන් දිනය සමරණවා. මොහුගේ කේන්දරයට අනුව ඔහුගේ නම වී තිබුණේ ලේක්රාජ් කියායි. ඒ ඔහු උපතින් ලද නමයි. සංගම යුගයේදී පරමාත්ම පියා ඇතුලුවුණු පසු ඔහු ඔහුගේ නම වෙනස් වුණා. ඔහු තම විශ්‍රාමික අවදියේදී සිටියදි පරමාත්ම පියා ඔහුගේ නම වෙනස් කරවනවා. ඒ සන්නාසිවරුන්ගේ නම් වෙනස් වන්නේ ඔවුන් තම ගෙවල් දොරවල් අතහැර දමා ගිය පසුවයි. මොහු නිවසේම ජීවත් වෙනවා. මම ඔහුට බ්‍රහ්ම කියා නම තබන්නේ බ්‍රහ්මිණ්වරුන් අවශ්‍යවන නිසායි. මම ඔබලාව මට අයිති කරවාගෙන ඔබලාව පිරිසිදු බ්‍රහමිණ්වරුන් බවට පත්කරවනවා. ඔබලාව පාරිශුද්ධ කරවනවා. ඔබලා උපතින්ම පාරිශුද්ධ නැහැ. පාරිශුද්ධ වීමට ඔබලාට ගුරුහරුකම් ලැබෙනවා. ප්‍රධානතම දෙය පාරිශුද්ධ වන්නේ කෙසේද යන්නයි. භක්ති මාර්ගයේ එකදු පුද්ගලයෙක්වත් වන්දනීය නොවන බව ඔබලා දන්නවා. ගුරුන් ආදිය ඉදිරියේ මිනිස්සු හිස නමනවා. මන්ද ඔවුන් තම ගෙවල් දොරවල් අතහැර දමා පැමිණ පාරිශුද්ධව සිටිනා නිසා ඒ වුනත් ඔවුන් වන්දනීයයි කියා කියන්න බහැ. වන්දනීය අය කිසිම කෙනෙක්ව සිහිකරන්නේ නැහැ. සන්නාසිවරුන් බ්‍රහ්ම ලෝකය සිහිකර යාක්ඥා කරනවා. ස්වර්ණම යුගයේ සිටින කිසිම කෙනෙක්ව සිහිකරන්නේ නැහැ. පරමාත්ම පියා කියනවා ඔබ දැන් එකම එක කෙනා සිහි කළ යුතුයි. ඒ භක්තියයි. ඔය ජීවාත්මයන් අදෘෂ්‍යමානයි. කිසිම කෙනෙක් ජීවාත්ම ගැන හරිහැටි දන්නේ නැහැ. ස්වර්ණම හා රිදී යුග වලදී පවා ශාරීරික ගත වන්නන් තම නම් ලබාගෙන චරිත රඟපානවා. නම් නොමැති නලුවන් සිටින්න බැහැ. ඔබ කොහේ සිටියත් ශරිරයට ලැබුණු නමක් ඔබට තියෙනවා. නමකින් තොර චරිතයක් රඟදක්වන්නේ කෙසේද? පරමාත්ම පියා කිය පැහැදිලි කර කියා දි තිබෙනවා. භක්ති මාර්ගයේ ඔබ මෙසේ ගායනා කළා කියලා: ඔබ පැමිණි විට මම භාරවන්නම්. නම අයිති වන්නේ ඔබටම පමණයි. ජීවාත්මය මෙසේ කීවා. භක්ති මාර්ගයේ නම් දී ඇති කිසිම ශාරීරික කෙනෙක්ව අපි වන්දනා නොකරන්නෙමු. ඔබ පැමිණි විට අපි අපව ඔබට කැප කරවමු. ඔහු පැමිණෙන්නේ කවදාද කියාවත් ඔබ දැනගෙන සිටියේ නැහැ. මිනිස්සු එක් එක් නම් වලින් එක් එක් ශාරීරික අය වන්දනා කර පැමිණියා. භක්තිය අවසානයක් කරා එන කල්පයේ දෙවන භාගය අවසන් වන විට පරමාත්ම පියා පැමිණෙනවා. ඔහු කියනවා ඔබ හැරෙන්න වෙන කිසිම කෙනෙක් මා සිහිකරන්නේ නැහැයි කියා. ඔබ උපතක් උපතක් පාසා කිය කියා පැමිණියා. මම මගේම ශරිරයවත් සිහිකරන්නේ නැහැ. කෙසේ වෙතත්, ඔබ මා ගැන දන්නේ නැහැ. ඉතින් කොහොමද මාව සිහිකරන්නේ? පරමාත්ම පියා දැන් මෙහි සිට ඔය දරුවන්ට කරුණු පහදා කියා දෙනවා ආදරණීය දරුවනි තමා ජීවාත්මයක් බව සලකා පරමාත්ම පියාව සිහිපත් කරන්න. පාරිශුද්ධ කරු වන්නේ පරමාත්ම පියා පමණයි. ඔහුව සිහි කිරිමෙන් ඔබ පාරිශුද්ධ හා සතෝප්‍රධාන් වේවි. ස්වර්ණම යුගයේදී හා රිදී යුගයේදී භක්තිය නැහැ. ඔබ පරමාත්ම පියාවත් වෙන කිසිම කෙනෙක්වත් එහිදි සිහිකරන්නේ නැහැ. එහි සතුටම හැරෙන්න වෙන කිසිම දෙයක් නැහැ. පරමාත්ම පියා පැහැදිලි කර කියා දෙනවා. තව තවත් සමීපයට පැමිණෙන විට ඔබ තව තවත් ඔබගේ කර්මාතීත් තත්ත්වය ලගාවනු ඇත. ස්වර්ණම යුගයේදී නව ලෝකයේ නව නිවහනක සිටිමේ මහා සතුටක් තිබෙනවා. පසුව එය 25% අඩුවන විට ඔබට දෙව්ලොව අමතක වුණා වගේ වෙනවා. ඒ නිසා පරමාත්ම පියා කියනවා අපි ඔබටම අයිති වෙනවා. ඔබ කියනා දේම පමණයි අප අසන්නේ කියා ඔබ ගායනා කළා කියලා ජීවාත්ම සත්තාවන් පරමාත්ම පියාට උත්තරීතර ජීවය යැයි කියනවා. ජීවාත්මයන් ඉතා කුඩා සියුම් තිත්ය. ඒ ජීවාත්ම සත්තාවක් දැක ගැනිමට නම් දිව්‍යමය දර්ශනයක් අවශ්‍යයි. ඔබට ජීවයක් කෙරෙහි ඇස් යොමු කරන්න බැහැ. තමන් එතරම් කුඩා ජීව තිතතක් කියා සලකා පරමාත්ම පියාව සිහිකිරිමට උත්සහයක් අවශ්‍යයි. මිනිස්සු ජීවයේ දර්ශනයක් දැකිමට උතසහ දරන්නේ නැහැ. ඔවුන් උත්සහ දරන්නේ උත්තරීතර ජීවයේ දර්ශනයක් දැකිමටයි. ඔහු හිරු දහසකටවත් වඩා දීප්තිමත් කියා ඔවුන් අසා තිබෙනවා. කෙනෙක්ට දර්ශනයක් ලැබුණු විට එය ඉතාමත් දීප්තිමත් කියා ඔවුන් කියන්නේ ඔවුන් එසේ අසා තිබෙන නිසායි. දැඩි භක්තියකින් වන්දනා කරනා කෙනෙක්ව මිනිසුන්ට දර්ශනය වෙනවා. නැති නම් ඔවුන්ට ඒ කෙරෙහි ශ්‍රද්ධාවක් ඇති වන්නේ නැහැ. පරමාත්ම පියා කියනවා ජීවාත්ම සත්තාවක් දැක නොමැති නම් ඔවුන්ට පරමාත්ම ජීවය දකින්නේ කෙසේද? ජීවයක්වත් දැක ගන්නේ කෙසේද? මිනිසුන්ට ශාරිරක රූප තිබෙනවා. ඔවුන්ට නම් තිබෙනවා. නමුත් ජීවාත්ම සත්තාව ඉතාම කුඩා තිතක්. එය දැකිය හැක්කේ කෙසේද? කෙතරම් උත්සහ කළත් මේ පියවි ඇස් දෙකින් ජීවයක් දැකිය නොහැකියි. ඔය සෑම ජීව සත්තාවක්ම දැනුම නැමැති සියුම් ඇස ලබනවා. ඔය ජීවාත්මයන් කෙතරම් කුඩාදැයි

කියා ඔබලාට දැන් තේරෙනවා. ජීවාත්ම සත්තාවක් වන මා තුළ උපත් 84 ක චරිත කොටසක් පටිගත වී තිබෙනවා. මා එය රඟදැක්විය යුතුයි. තමාව උසස් කර ගැනිම සඳහා ඔබ පරමාත්ම පියාගේ උපදෙස් ලබනවා. ඔබ දිව්‍යමය ගුණ ධර්ම උකහා ගත යුතුයි. ඔබගේ කෑම බීම රාජකීය විය යුතුයි. හැසිරීම් රටාවත් රාජකීය විය යුතුයි. මන්ද ඔබලා දේවතාවරුන් වෙමින් සිටිනවා. දේවතාවරුන් වන්දනීයයි ඔවුන් කිසිම විටෙක කිසිම කෙනෙක්ව වන්දනා කරන්නේ නැහැ. ඔවුන් ද්විත්ව ඔටුණු පළන් අයයි. ඔවුන් කිසිම කෙනෙක්ව වන්දනා කරන්නේ නැහැ. එම නිසා ඔවුන් වන්දනියයි. ස්වර්ණම යුගයේදී කිසිම කෙනෙක්ව වන්දනා කිරිමට අවශ්‍ය වන්නේ නැහැ. නමුත් ඔවුන් අනිවාර්යයෙන්ම සෑම කෙනෙක්ටම ගරු කරනවා. කෙනෙක් ඉදිරියේ හිස නමා ආචාර කරනවා යනු ගරු කිරිමකි. කිසිම කෙනෙක්ව තම හදවතේ තබාගෙන සිටිමක් අවශ්‍යවන්නේ නැහැ. ගෞරවය දිය යුතුයි. උදාහරණයක් ලෙස කිවහොත් රටක ජනාධිපති කෙනෙක්ට සෑම කෙනෙක්ම ගරු කරනවා. මන්ද එය ඉහළ නිලයක් කියා කවුරුත් දන්න නිසා. ඔබ කිසිම කෙනෙක්ට හිස නැමිය යුත්තේ නැහැ. එම නිසා පරමාත්ම පියා පැහැදිලි කර කියා දෙනවා මෙම ඥාන මාර්ගය සම්පූර්ණයෙන්ම වෙනස් වුවක්. මෙහිදී ඔබට කිරිමට ඇත්තේ තමන් ජීවාත්මයක් කියා සැලකීම පමණයි. ඔබට මෙය අමතක වෙලා. ඔබ ශරිරයේ නම සිහිකරනවා. සෑම දෙයක්ම නමකින් කළ යුතුයි. නමක් නැති කෙනෙක්ට ආමන්ත්‍රණය කළ හැක්කේ කෙසේද? තම තමන්ගේ චරිත රඟදක්වන ශාරිරක අය වුවත් ඔබලා ශිව බාබාව තම සිහියේ තබාගෙන සිටිය යුතුයි. ක්‍රිෂ්ණා බැතිමතුන් තමන් සිහිකල යුත්තේ ක්‍රිෂ්ණාව පමණක් කියා විශ්වාස කරනවා. තමන් බලන බලන තැන සිටින්නේ ක්‍රිෂ්ණායි කියා ඔවුන් කියනවා. මමත් ක්‍රිෂ්ණා. ඔබත් ක්‍රිෂ්ණා කියා ඔවුන් අදහනවා. ඔහෝ. නමුත් ඔබගේ නම ඔහුගේ නමින් වෙනස් ඉතින් කොහොමද සෑම කෙනෙක්ම ක්‍රිෂ්ණා වෙන්නේ? සෑම කෙනෙකුගේම නම ක්‍රිෂ්ණා විය නොහැකියි. ඔවුන් තම තමන්ගේ හිතට එන දෙවල් කියනවා. පරමාත්ම පියා දැන් කියනවා භක්ති මාර්ගයේ සෑම රූපයක්ම අමතක කර දමා පරමාත්ම පියාව පමණක් සිහිපත් කරන්න. ඔබ පාරිශුද්ධකරුයි කියා කියන්නේ නැහැ. හනුමන් හා අන් අය පාරිශුද්ධකරුවන් වෙන්නේ නැහැ. රූප ගණනාවක් තිබෙනවා. නමුත් ඒ කිසිම කෙනෙක් පාරිශුද්ධකරු වෙන්නේ නැහැ. ශරිර ඇති ඒ කිසිම දේවතාවරියක් පාරිශුද්ධ කරු වෙන්නේ නැහැ. තම තමන්ගේ හිතේ හැටියට මිනිස්සු අත් හයක් අටක් ඇති දේව රූප සාදනවා. ඒ කවුරුන්දැයි කියා ඔවුන් දන්නේ නැහැ. පාරිශුද්ධ කරු වන පරමාත්ම පියාගේ සහායක දරුවනුයි. කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. ඔබගේ බාහිර ස්වරූපය ඉතාමත් සාමාන්‍යයි. ඒ ශරිර විනාශ වී යාවි. ඔබගේ රූපය ආදිය ඉතිරි වේවි කියා කියන්න බැහැ. ඒ සියල්ල විනාශ වේවි. ඇත්තටම කියනවා නම් ඔබලා දේවතාවරියනුයි. සීතා දේවි, අර දේවි මේ දේවි කියා කියනවා. රාම් දේවි කියා කියන්නේ නැහැ. දේවි හෝ ශ්‍රීමති කියා තමයි කියන්නේ. නමුත් ඒකත් වැරදියි. ඔබ දැන් පාරිශුද්ධ වීමට උත්සහ දැරිය යුතුයි. පැමිණ අපිරිසිඳු අපව පාරිශුද්ධ කරවන්න කියා ඔබ කියනවා. අපව ලක්ෂ්මී හෝ නාරායන් කරවන්නැයි කියා ඔබ කියන්නේ නැහැ. අපිරිසිඳු ඔබව පාරිශුද්ධ කරවන්නේ පරමාත්ම පියාම පමණයි. සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් ඔබ නාරායන් බවට පත්කරන්නේ ඔහු පමණයි. අශාරිරක කෙනාට පාරිශුද්ධ කරුයැයි කියනවා. සත්‍ය නාරායන්ගේ කතාව කියන්නා ලෙස පෙන්වා ඇත්තේ වෙනත් කෙනෙක්. සත්‍ය නාරායන්ගේ කතාව කියා අපව අමරණීය කරවන්න කියා හෝ සාමාන්‍ය අපව නාරායන් කරවන්න කියා හෝ ඔවුන් කියන්නේ නැහැ. ඔවුන් කියන්නේ පැමිණ අපව පාරිශුද්ධ කරවන්න කියා පමණයි. සත්‍ය නාරායන්ගේ කතාව කියා දී ඔබව පාරිශුද්ධ කරවන්නේ බාබාම පමණයි. ඉන් පසු ඔබ ඒ සත්‍යය කතාව අන් අයටත් කියා දෙනවා. වෙන කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. ඔබ පමණයි දන්නේ. ඥාති හිතමිතුරන් සහෝදර සහෝදරියන් ඔබගේ ගෙදරම සිටියත් ඔවුන්ටවත් මෙය තේරෙන්නේ නැහැ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබව උසස් කර ගැනිමට නම් පරමාත්ම පියාගෙන් ලැබෙන ශ්‍රීමත් අනුගමනය කර දිව්‍යමය ගුණධර්ම ධාරණය කර ගන්න. ඔබගේ කෑම, බීම හා හැසිරීම් රටාව ඉතාමත් රාජකීය විය යුතුයි.
2. එකිනෙකාව සිහිකරන්න එපා. නමුත් අනිවාර්යෙන්ම සැමට ගරු කරන්න. පාරිශුද්ධ වීමට උත්සාහ දරා අන් අයවද එයට දිරිමත් කරවන්න.

**වරදානය:** ඔබ සැමදා සතුටින් සිටිමින්, නීරස (වියළි) වාතාවරණයක අන් අයට සතුටේ රසය අත්විඳීමට ඉඩ සලසත්වා.

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

***** ඕම් ශාන්ති *****

කර්මතීත් යන්නෙන් අදහස් කරන්නේ ඔබ කර්මයෙන් ඔබ්බට යාම නොවේ. කර්මයෙන් වෙන් නොවන්න, නමුත් කර්මයේ කිසිදු බන්ධනයකින් සිර වීමෙන් වෙන් වන්න. මෙය කර්මතීත් වීම ලෙස හැඳින්වේ. කර්ම යෝගයේ අවධිය ඔබට කර්මතීත් අවධිය අත්විඳීමට හැකියාව ලබා දෙයි. කර්ම යෝගියෙකු අතිශයින්ම සෙනෙහෙවන්තව හා නොබැඳිව සිටී. මෙම අවධියේ දී, කොතරම් විශාල කාර්යයක් වුව ද එයට කොපමණ උත්සාහයක් දැරුවත්, ඔබ කිසිදු කාර්යයක් නොකරන බවක් දැනෙනු ඇත, නමුත් ඔබ ක්‍රීඩාවක් කරන බවක් දැනේ.